සියලු ම හිමිකම් ඇවිරිණි.

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අදියර 02 විභාගය - 2026 ජූලි

(2801) මූල්‍ය සහ පිරිවැය ගිණුම්කරණය

(Financial & Cost Accounting)

2026-07-25
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
උත්තර ලිවීම සඳහා - පැය 03 යි.

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

<u>A කොටස</u>

වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

01 වන ප්‍රශ්නය

අංක 1.1 සිට 1.5 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.

1.1 මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග අතුරෙන්, සමාගමක මූල්‍ය තත්ත්වය මැනීමට සෘජුවම සම්බන්ධ වන මූලිකාංගයක් වන්නේ:

(1) ආදායම. (2) ශේෂ පිරික්සුම. (3) වියදම්. (4) වගකීම්.

(ලකුණු 02)

1.2 පහත සඳහන් පිරිවැයකරණ ක්‍රම සලකා බලන්න:

(a) කාර්යය පිරිවැයකරණය.

(b) කොන්ත්‍රාත් පිරිවැයකරණය.

(c) පෙරසැරි පිරිවැයකරණය.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, විශේෂිත ඇණවුම් පිරිවැයකරණ ක්‍රමය / ක්‍රම වන්නේ:

(1) **(c)** පමණි. (2) **(a)** සහ **(b)** පමණි.

(3) **(a)** සහ **(c)** පමණි. (4) **(b)** සහ **(c)** පමණි.

(ලකුණු 02)

1.3 **සීමාසහිත ඇල්ෆා සමාගමේ** 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු දී ඇත:

	පිරිවැය ගිණුම් අනුව (රු.)	**මූල්‍ය ගිණුම් අනුව (රු.)**
ආරම්භක තොග:		
අමු ද්‍රව්‍ය	64,000	73,000
නිමි භාණ්ඩ	82,000	69,000
අවසාන තොග:		
අමු ද්‍රව්‍ය	56,000	68,000
නිමි භාණ්ඩ	90,000	87,000

පිරිවැය ගිණුම් අනුව ලාභය රු.454,000/- ක් නම්, මූල්‍ය ගිණුම් අනුව ලාභය වනුයේ:

(1) රු.441,000/-. (2) රු.467,000/-. (3) රු.461,000/-. (4) රු.447,000/-.

(ලකුණු 02)

1.4 **සීමාසහිත X සමාගම** විසින් 2023 අප්‍රේල් 01 දින පිරිවැය රු.5,000,000/- කට අත්පත් කරගත් මෝටර් රථයක් 2025 ජූනි 30 දින රු.4,500,000/- කට විකුණන ලදී. මෝටර් රථයේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය වසර 5 ක් වන අතර, සමාගම විසින් එහි මෝටර් රථ, පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි. මෝටර් රථය ඉවත්කිරීමේ ලාභය වූයේ:

(1) රු.750,000/-. (2) රු.1,750,000/-. (3) රු.2,000,000/-. (4) රු.3,000,000/-.

(ලකුණු 02)

1.5 නිෂ්පාදන සමාගමකින් පසුගිය වසර සඳහා පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

	අයවැයගත	**සත්‍ය**
නිෂ්පාදන පොදුකාර්ය (රු.)	2,000,000	1,900,000
සෘජු ශ්‍රම පැය ගණන	100,000	90,000

නිෂ්පාදන පොදුකාර්ය:

(1) රු.100,000/- කින් ඌන අන්තර්ග්‍රහණය වී ඇත. (2) රු.100,000/- කින් අධි අන්තර්ග්‍රහණය වී ඇත.

(3) රු.200,000/- කින් ඌන අන්තර්ග්‍රහණය වී ඇත. (4) රු.200,000/- කින් අධි අන්තර්ග්‍රහණය වී ඇත.

(ලකුණු 02)

*අංක **1.6** සිට **1.10** දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.6 1890 හවුල් ආඥා පනතේ 24 වන වගන්තියේ සඳහන් ප්‍රතිපාදන දෙකක්(02) සඳහන් කරන්න. (ලකුණු 02)

1.7 ද්‍රව්‍ය පාලනයේ අරමුණු තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

1.8 "මූල්‍ය ගිණුම්කරණය" සහ "පිරිවැය ගිණුම්කරණය" අතර ඇති වෙනස්කම් තුනක්(03) සඳහන් කරන්න.

(ලකුණු 03)

1.9 **X** සහ **Y** යනු පිළිවෙලින් ලාභා'ලාභ 3 : 2 අනුපාතයට බෙදා ගන්නා **Moon** හවුල් ව්‍යාපාරයේ, හවුල්කරුවෝ වෙති. 2025 අප්‍රේල් 01 දින, නව හවුල්කරුවෙකු වශයෙන් **Z** සම්බන්ධ වූ අතර, හවුල්කරුවන් අතර ලාභා'ලාභ සම සමව බෙදාගැනීමට තීරණය කරන ලදී.

X සහ **Y** ගේ කැපකළ අනුපාතය (sacrificing ratio) ගණනය කරන්න. (ලකුණු 03)

1.10 **සීමාසහිත Mag සමාගම,** පළමු ලැබීම් පළමු නිකුතු [First In First Out (FIFO)] ක්‍රමය භාවිත කරමින්, එහි තොගය අගය කරනු ලබයි. තොග සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු සමාගමේ වාර්තාවලින් උපුටාගන්නා ලදී:

දිනය	විස්තරය	ඒකකයක මිල (රු.)	ප්‍රමාණය (ඒකක)
2026.03.01	ආරම්භක ශේෂය	58	150
2026.03.08	මිලදී ගැනුම්	45	250
2026.03.15	විකුණුම්	-	200
2026.03.24	මිලදී ගැනුම්	52	160

2026 මාර්තු 31 දිනට තොගයේ වටිනාකම ගණනය කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

A කොටසෙහි අවසානය

B කොටස

(මුළු ලකුණු 50)

02 වන ප්‍රශ්නය

කේවලස්වාමි ව්‍යාපාරයක් වන **"Ceylon Taste"** හි අයිතිකරු වන **රවී,** ගොවීන්ගෙන් කුළු බඩු මිලදීගෙන ඒවා සැකසීමෙන් සහ වටිනාකම් එකතු කිරීමෙන් පසු, නියෝජිතයන් හරහා මැද පෙරදිග රටවලට අපනයනය කරයි.

Ceylon Taste හි වත්කම් සහ වගකීම් පහත සඳහන් පරිදි වේ: *(රු.)*

	2026 මාර්තු 31 දිනට	2025 අප්‍රේල් 01 දිනට
තොගය	1,935,000	1,974,500
වෙළෙඳ ලැබිය යුතු මුදල්	950,700	829,200
මුදල් සහ බැංකු ශේෂ	?	1,276,500
ස්කන්ධය (ප්‍රාග්ධනය)	?	2,935,200
වෙළෙඳ ගෙවිය යුතු මුදල්	2,100,000	1,145,000

2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) වාර්තාවලට අනුව, **Ceylon Taste** විසින් වර්ෂය තුළදී, පහත සඳහන් ගනුදෙනු ණය පදනමට සිදුකොට ඇත:

	රු.
විකුණුම්	35,000,000
ගැනුම්	21,000,000

(2) 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී, පහත සඳහන් ගෙවීම් මුදලින් සිදුකරන ලදී:

	රු.
කාර්යාල කුලිය	1,240,000
බෙදාහැරීමේ වියදම්	1,680,000
වාහන නඩත්තු වියදම්	302,400
වාහන කුලිය	960,000
කාර්යාල නඩත්තු වියදම්	44,000
විදුලිය සහ ජලය	400,000
වැටුප්	4,200,000
රවී විසින් ඔහුගේ පෞද්ගලික පරිහරණය සඳහා ලබාගත් මුදල්	1,200,000

(3) 2026 මාර්තු මාසය සඳහා විදුලිය සහ ජල වියදම් රු.100,000/- ක් වන අතර, එය 2026 අප්‍රේල් මාසයේදී පියවන ලදී.

ඔබ විසින් කළ යුතු දෑ:

Ceylon Taste සඳහා පහත සඳහන් දෑ **ගණනය කරන්න:**

(a) 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ ලාභය. (ලකුණු 07)

(b) 2026 මාර්තු 31 දිනට ප්‍රාග්ධන (ස්කන්ධ) ශේෂය. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

03 වන ප්‍රශ්නය

අසිත, බන්දු සහ **වරිත්, ABC ඇසෝසියේට්ස්** හි හවුල්කරුවන් වෙති.

(1) හවුල් ගිවිසුමේ පහත සඳහන් දෑ ඇතුලත් වේ:

- **අසිත, බන්දු** සහ **වරිත්** , ලාභා'ලාභ පිළිවෙලින් 2 : 2 : 1 අනුපාතයට බෙදා ගනු ලැබේ.
- හවුල් ව්‍යාපාරය කළමනාකරණය කිරීම සඳහා **අසිත, බන්දු** සහ **වරිත්** පිළිවෙලින් රු.300,000/-, රු.200,000/- සහ රු.150,000/- ක මාසික වැටුපකට හිමිකම් ලබති.
- 2025 අප්‍රේල් 01 දිනට පැවති ආරම්භක ප්‍රාග්ධන ගිණුම් ශේෂයන් මත, 10% ක වාර්ෂික පොලියක් ලැබීමට හවුල්කරුවන්ට හිමිකමක් තිබේ.
- 2025 අප්‍රේල් 01 දිනට පැවති ජංගම ගිණුම් ශේෂයන් මත, 5% ක වාර්ෂික පොලියක් ලැබීමට හවුල්කරුවන්ට හිමිකමක් තිබේ.

(2) 2025 අප්‍රේල් 01 දිනට, හවුල් ව්‍යාපාරයේ ගිණුම් පොත්වලින් පහත සඳහන් ශේෂයන් උපුටාගෙන ඇත:

(රු.'000)

	හර	බැර
ප්‍රාග්ධන ගිණුම් ශේෂ:		
අසිත		200,000
බන්දු		160,000
වරිත්		100,000
ජංගම ගිණුම් ශේෂ:		
අසිත		20,000
බන්දු		10,000
වරිත්		5,000

(3) 2026 මාර්තු 31 දින, **වරිත්** හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම යැමට තීරණය කළ අතර, **අසිත** සහ **බන්දු** ලාභා'ලාභ සම සමව බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරය එම නමින්ම පවත්වාගෙන යාමට එකඟ වූහ.

(4) 2026 මාර්තු 31 දිනට, හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු.18,000,000/- ක් ලෙස අගය කළ අතර, එය කීර්තිනාම ගිණුමක් පවත්වා ගැනීමෙන් තොරව හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හරහා ගැලපිය යුතුය.

(5) 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා, හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු.120,000,000/- ක් විය.

(6) **වරිත්** ට ගෙවිය යුතු සියළුම මුදල්, 2026 අප්‍රේල් 01 දින සම්පූර්ණයෙන් ගෙවා නිම කළ යුතුය.

ඔබ විසින් කළ යුතු දෑ:

2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා, **ABC ඇසෝසියේට්ස්** හි පහත සඳහන් දෑ **පිළියෙල කරන්න:**

(a) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්. (ලකුණු 06)

(b) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

04 වන ප්‍රශ්නය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **South Rowing සමාජය** හි ගිණුම් පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදි. මෙම සමාජය, 2022 ජනවාරි 01 දින සිට තම මෙහෙයුම් ආරම්භ කරන ලදි.

(1) වර්ෂය තුළදී, පහත සඳහන් වියදම් දරණ ලද අතර, ආදායම් උපයාගන්නා ලදි:

	රු.
විකුණුම් - අවන්හල	2,544,000
මිලදී ගැනුම් - අවන්හල	1,526,400
වැටුප් සහ වේතන	1,440,000
විදුලිය සහ ජලය	780,000
කුලී වියදම්	540,000
සමාජයේ වෙනත් වියදම්	75,000

වැටුප් හා වේතන, විදුලිය හා ජලය සහ කුලී වියදම්වලින් 20% ක් අවන්හලට අදාල වියදම් වේ.

(2) සමාජය සතු වත්කම් පහත පරිදි වේ: *(රු.)*

	2025 දෙසැම්බර් 31 දිනට	2025 ජනවාරි 01 දිනට
තොගය - අවන්හල	285,000	175,000
කාර්යාල උපකරණ - අවන්හල (පිරිවැයට)	768,000	768,000
වෙනත් කාර්යාල උපකරණ (පිරිවැයට)	2,500,000	1,500,000
ගෘහ භාණ්ඩ - අවන්හල (පිරිවැයට)	300,000	300,000
වෙනත් ගෘහ භාණ්ඩ (පිරිවැයට)	250,000	250,000
ස්ථාවර තැන්පතුවල ආයෝජනය	805,000	750,000

(3) පොලියත් සමඟ ස්වයංක්‍රීයව අළුත් වන පදනම මත; ස්ථාවර තැන්පතු මත ආයෝජනය බැංකු සමඟ සිදුකර ඇති අතර, වර්ෂය තුළදී නව ආයෝජනයන් සිදුකර නොමැත.

(4) 2025 ජනවාරි 01 දිනට, සමාජයේ සාමාජිකයින් සංඛ්‍යාව 120 ක් විය. 2025 ජනවාරි 01 දිනට, 2024 වර්ෂය සඳහා සාමාජිකයින් 25 දෙනෙකු සාමාජික ගාස්තු ගෙවා නොමැති අතර, සාමාජිකයින් 5 දෙනෙකු 2025 වර්ෂය සඳහා ඉදිරියට සාමාජික ගාස්තු ගෙවා ඇත. 2025 දෙසැම්බර් 31 දිනට, සාමාජිකයින් 4 දෙනෙකු 2025 වර්ෂය සඳහා සාමාජික ගාස්තු ගෙවා නොමැති අතර, සාමාජිකයින් 8 දෙනෙකු 2026 වර්ෂය සඳහා සාමාජික ගාස්තු ඉදිරියට ගෙවා ඇත. වර්ෂය තුළදී, සාමාජිකයින් සංඛ්‍යාවේ වෙනසක් සිදුවී නොමැත.

(5) සාමාජිකයෙකු සඳහා වාර්ෂික සාමාජික ගාස්තුව රු.25,000/- කි.

(6) 2025 ජූලි 01 දින, **South Rowing සමාජයේ** කාර්යාලයේ භාවිතය සඳහා රු.1,000,000/- ක් වටිනා කාර්යාල උපකරණ මිලට ගන්නා ලදි.

(7) පිරියත සහ උපකරණ, පහත සඳහන් අනුපාතයන් යොදාගෙන සරල මාර්ග ක්‍රමයට, පිරිවැය මත ක්ෂය කළ යුතුය:

කාර්යාල උපකරණ	20%
ගෘහ භාණ්ඩ	15%

ඔබ විසින් කළ යුතු දෑ:

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **South Rowing සමාජයෙහි** පහත සඳහන් දෑ **පිළියෙළ කරන්න:**

(a) සාමාජික ගාස්තු ගිණුම. (ලකුණු 03)

(b) ආදායම් සහ වියදම් ගිණුම. (ලකුණු 07)

(මුළු ලකුණු 10)

05 වන ප්‍රශ්නය

(A) **සීමාසහිත රෝස් සමාගමේ, Y නිෂ්පාදිතය** ට අදාලව පහත සඳහන් තොරතුරු සළකා බලන්න:

වාර්ෂික ඉල්ලුම	ඒකක 9,000
ඒකකයක ගැනුම් මිල	රු.10/-
ඇණවුම් පිරිවැය	ඇණවුමකට රු.200/-
ඒකකයක වාර්ෂික රඳවා ගැනීමේ පිරිවැය	රු.2.50
පොරොත්තු කාලය	මාස 2 - 4
භාවිතය	ඒකක 500 - 1,000

ඔබ විසින් කළ යුතු දෑ:

Y නිෂ්පාදිතය සඳහා, පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) ආර්ථික ඇණවුම් ප්‍රමාණය [Economic Order Quantity (EOQ)]. (ලකුණු 02)

(b) යළි ඇණවුම් මට්ටම (Re-order Level). (ලකුණු 02)

(c) උපරිම තොග මට්ටම. (ලකුණු 02)

(B) **සීමාසහිත සළුපිළි (පෞද්ගලික) සමාගම,** ඇඟළුම් නිෂ්පාදකයෙකි.

පහත සඳහන් තොරතුරු, 2026 මැයි මාසයේ අවසන් සතිය සඳහා සමාගමේ සේවකයෙකුට අදාලව සපයනු ලැබේ:

දිනක සාමාන්‍ය වැඩකරන පැය ගණන	පැය 9 කි (සතියකට වැඩකරන දින 5 කි)
පැයක් සඳහා මූලික ගෙවීම	රු.375/-
ඒකකයක් නිපදවීම සඳහා ගතවන සම්මත කාලය	මිනිත්තු15
මූලික ප්‍රසාද දීමනාව	ඉතිරි කරන ලද කාලයෙන්, 80% ක්, මූලික ශ්‍රම අනුපාතයට
සතිය තුළදී නිෂ්පාදනය කළ ඒකක ප්‍රමාණය	ඒකක 300

ඔබ විසින් කළ යුතු දෑ:

අවසන් සතිය සඳහා සේවකයාගේ මුළු ඉපැයීම **ගණනය කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

06 වන ප්‍රශ්නය

2025 දෙසැම්බර් මාසය සඳහා, පහත සඳහන් තොරතුරු **සීමාසහිත PQR (පෞද්ගලික) සමාගමෙන්** උපුටාගන්නා ලද අතර, සමාගම සතුව නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් (P සහ A) සහ එක් සේවා දෙපාර්තමේන්තුවක් ඇත.

(1) සමාගම විසින් 2025 දෙසැම්බර් මාසය සඳහා, පහත සඳහන් නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය, ඇස්තමේන්තුගත කර ඇත:

පිරිවැය අයිතමය	පිරිවැය (රු.)
කුලිය	60,000
විදුලිය	45,000
සේවක සුභසාධනය	40,000
යන්ත්‍ර ක්ෂය	20,000

(2) පහත සඳහන් අතිරේක තොරතුරු ද ඔබට සපයා ඇත:

	නිෂ්පාදන දෙපාර්තමේන්තු		සේවා දෙපාර්තමේන්තුව
	P දෙපාර්තමේන්තුව	A දෙපාර්තමේන්තුව	
වක්‍ර ද්‍රව්‍ය (රු.)	80,000	50,000	20,000
වක්‍ර ශ්‍රමය (රු.)	30,000	7,000	3,000
බිම් ප්‍රමාණය (වර්ග අඩි)	2,000	1,500	500
විදුලි පරිභෝජනය (කිලෝවොට්)	300	100	50
සේවක සංඛ්‍යාව	250	200	50
යන්ත්‍රවල වටිනාකම (රු.)	500,000	300,000	200,000
සෘජු ශ්‍රම පැය ගණන	2,500	1,250	-
පිරිවැය විභජනය - **සේවා දෙපාර්තමේන්තුව**	55%	45%	-
නිෂ්පාදිතයක් සඳහා අවශ්‍ය සෘජු ශ්‍රම පැය ගණන	2	1	-

(3) නිෂ්පාදිතයක් සඳහා ඇස්තමේන්තුගත සෘජු පිරිවැය පහත සඳහන් පරිදි වේ:

එක් නිෂ්පාදිතයක් සඳහා	රු.
සෘජු ද්‍රව්‍ය	250
සෘජු ශ්‍රමය	120
ප්‍රාථමික පිරිවැය	**370**

ඔබ විසින් කළ යුතු දෑ:

(a) එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා, පොදුකාර්ය පිරිවැය වෙන්කර විභජනය කරනු ලබන්නේ කෙසේදැයි දැක්වෙන ප්‍රකාශනයක් **පිළියෙල කරන්න**. (ලකුණු 07)

(b) එක් නිෂ්පාදිතයක ඇස්තමේන්තුගත මුළු නිෂ්පාදන පිරිවැය **ගණනය කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

B කොටසෙහි අවසානය

C කොටස

(මුළු ලකුණු 25)

07 වන ප්‍රශ්නය

සීමාසහිත Path (පෞද්ගලික) සමාගමේ 2026 මාර්තු 31 දිනට, ශේෂ පිරික්සුම පහත පරිදි වේ: *(රු.'000)*

	හර	බැර
ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 300,000)		30,000
2025 අප්‍රේල් 01 දිනට, රඳවාගත් ඉපැයීම්		6,834
2025 අප්‍රේල් 01 දිනට, පොදු සංචිතය		3,200
පිරියත සහ උපකරණ, පිරිවැයට:		
මෝටර් වාහන	25,000	
යන්ත්‍ර	24,000	
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	1,500	
2025 අප්‍රේල් 01 දිනට, සමුච්චිත ක්ෂය:		
මෝටර් වාහන		3,125
යන්ත්‍ර		3,000
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්		300
2026 මාර්තු 31 දිනට තොගය, පිරිවැයට	2,902	
වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල්	4,990	2,093
අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල්	15,757	
12% ණයකර (එකක් රු.100/- බැගින් 25,000)		2,500
අයදුම් සහ විභජන ගිණුම		3,000
විකුණුම්		46,464
විකුණුම් පිරිවැය	17,957	
රක්ෂණය	150	
වැටුප් සහ වේතන	1,900	
විදුලිය සහ ජලය	400	
කාර්යාල කුලිය	900	
වෙනත් පරිපාලන වියදම්	800	
විකුණුම් කොමිස්	1,400	
ප්‍රචාරණය	600	
ගමන් සහ ප්‍රවාහන වියදම්	900	
වෙනත් බෙදාහැරීමේ වියදම්	296	
ණයකර පොලිය	150	
වෙනත් මූල්‍ය වියදම්	189	
ගෙවූ ආදායම් බදු	725	
	100,516	**100,516**

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2026 මාර්තු 31 දිනට තොගයේ ඇතුළත් රු.150,000/- ක වටිනාකමක් ඇති තොගයක්, සම්පූර්ණයෙන්ම හානි වී ඇති බවට 2026 අප්‍රේල් 02 දින සොයා ගන්නා ලදී.

(2) 2026 මාර්තු 01 දින, සමාගම විසින් සාමාන්‍ය කොටස් 25,000 ක් එකක් රු.100/- බැගින් නිකුත් කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබූ අතර, කොටස් 30,000 ක් සඳහා අයදුම්පත් ලැබුණි. 2026 මාර්තු 31 දින කොටස් විභජනය කරන ලද අතර, කොටස් මත වැඩිපුර ලැබුණු මුදල්, ඊට පසුදින ආපසු ලබාදෙන ලදී. ලැබුණු මුළු මුදල, අයදුම් සහ විභජන ගිණුමට බැර කරන ලදී. මේ හැරුණු විට, මේ සම්බන්ධයෙන් වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.

(3) වසරේ දෙවන අර්ධයට අදාළ ණයකර පොලිය, 2026 මාර්තු 31 දිනට වෙන්කර හෝ ගෙවා නොමැත.

(4) පිරියත සහ උපකරණ, සරල මාර්ග ක්‍රමයට, පිරිවැය මත ක්ෂය කරනු ලබන අතර, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ:

මෝටර් වාහන	වර්ෂ 4
යන්ත්‍ර	වර්ෂ 8
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	වර්ෂ 5

(5) 2026 මාර්තු 31 දිනට, පහත සඳහන් උපචිත සහ ඉදිරියට කළ වියදම් පොත්වල ගිණුම්ගත කළ යුතුය:

ඉදිරියට ගෙවූ රක්ෂණය : රු.16,000/-

ගෙවිය යුතු විගණන ගාස්තු : රු.95,000/-

(6) 2026 මාර්තු 31 දිනට පැවති වෙළෙඳ ලැබිය යුතු මුදල් මත, 10% ක ප්‍රතිපාදනයක් පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදී.

(7) 2025/26 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු වගකීම රු.950,000/- ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇති අතර, සමාගම විසින් වර්ෂය තුළදී, කාර්තුමය ආදායම් බදු වාරික වශයෙන් රු.725,000/- ක් ගෙවා ඇත.

(8) වර්ෂය තුළදී රු.500,000/- ක් පොදු සංචිතයට මාරු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදී.

(9) මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය, 2026 මැයි 30 දින ලබාදී ඇත.

ඔබ විසින් කළ යුතු දෑ:

සීමාසහිත Path (පෞද්ගලික) සමාගමේ කළමනාකාරිත්වයේ භාවිතය සඳහා, පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභ/ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 13)

(b) 2026 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 12)

(මුළු ලකුණු 25)

C කොටසෙහි අවසානය

කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව			
මට්ටම	**ක්‍රියා ලැයිස්තුව**	**නිර්වචනය**	**සිසුන් සඳහා විස්තරාත්මක උපදෙස්**
මතක තබා ගැනීම කරුණු,පද, මූලික සංකල්ප හෝ පිළිතුරු, ඒවායේ තේරුම නිසි ලෙස තේරුම් නොගෙන සිහිපත් කිරීම වේ	හඳුනා දක්වන්න	කෙනෙකුගේ හෝ යමක් හඳුනා දැක්වීම.	මාතෘකාවේ ප්‍රධාන කොටස් සොයා නම් කරන්න.
	නිර්වචනය කරන්න	වචනයක් හෝ සංකල්පයක් තේරුම් ගැනීම.	පදයක හෝ සංකල්පයක පැහැදිලි අර්ථයක් ලබා දීම.
	හඳුනා ගන්න	පෙර දැක නොමැති දෙයක් පිළිබඳ දැනුවත්භාවය.	පෙර ඉගෙනීම්වලින් යමක් සොය දැන ගැනීම.
	සඳහන් කරන්න	පැහැදිලි සහ සංක්ෂිප්ත ලෙස තොරතුරු ප්‍රකාශ කිරීම.	ප්‍රධාන කරුණු හෝ සංකල්ප සරල ආකාරයෙන් ප්‍රකාශ කිරීම.
	ලැයිස්තුගත කරන්න	නම්, සංඛ්‍යා හෝ අයිතම මාලාවක්.	ප්‍රධාන කරුණු සංවිධානාත්මකව ලිවීම.
	සටහන් කරන්න	පද්ධතියකට (ගිණුම්කරණය නොවේ) තොරතුරු ඇතුලත් කිරීම.	අදාල විස්තර පැහැදිලිව හා නිවැරදිව ඇතුලත් කිරීම.
අවබෝධය තොරතුරුවල අර්ථය අවබෝධ කර ගැනීම සහ ඒවා අර්ථකථනය කිරීමට හෝ පැහැදිලි කිරීමට හැකිවීම.	ගොඩ නගන්න	මූලිකාංග ඒකාබද්ධ කිරීමෙන් යමක් ගොඩ නැගීම.	විවිධ කොටස් මගින් සමස්ථයක් ලෙස අර්ථවත් බවට පත් කිරීම.
	වෙනස් කොට දක්වන්න	දේවල් දෙකක් හෝ වැඩි ගණනක් අතර වෙනස්කම් හඳුනා ගැනීම.	සංකල්ප හෝ අයිතම අතර වෙනස්කම් අවධාරණය කිරීම.
	විමසන්න	මාතෘකාවක් පිළිබදව විවිධ අදහස් සහ මත සලකා බැලීම.	විවිධ දෘෂ්ඨිකෝණ ගවේශණය කර අවබෝධයක් ලබා දීම.
	පැහැදිලි කරන්න	යමක් පිළිබඳව වඩාත් විස්තරාත්මකව පැහැදිලි කිරීම.	තාර්කික සහ සවිස්තරාත්මක මත විස්තරයක් සැපයීම.
	ගෙනහැර දක්වන්න	කරුණක් පැහැදිලි කිරීම සඳහා උදාහරණ, ප්‍රස්ථාර හෝ දෘශ්‍ය භාවිතය.	සුදුසු උදාහරණ හෝ දෘශ්‍ය මාධ්‍ය සමග පැහැදිලි කිරීම් සඳහා සහය වීම.
	අර්ථකථනය කරන්න	තොරතුරු හෝ ක්‍රියාවන්හි අර්ථය පැහැදිලි කිරීම.	යමකින් අදහස් වන්නේ කුමක්දැයි ඔබේ වචනවලින් පැහැදිලි කිරීම.
	විස්තර කරන්න	යම්කිසි දෙයක් පිළිබඳව සවිස්තරාත්මක විස්තරයක්.	අදාල විස්තර ව්‍යුහගත ආකාරයට සැපයීම.
	සාරාංශගත කරන්න	ප්‍රධාන කරුණු පිළිබඳව කෙටි ප්‍රකාශයක්.	සංක්ෂිප්තව ඉදිරිපත් කිරීම.
භාවිතය අළුත් සහ සංකීර්ණ තත්වයන් යටතේ උගත් දැනුම භාවිතා කිරීම වන අතර මේ සඳහා දැනුම සහ කුසලතා ප්‍රායෝගිකව භාවිතා කිරීම අවශ්‍ය වේ.	භාවිත කරන්න.	යම්කිසි තත්වයන් තුළ දැනුම කුසලතා හෝ රීතීන් භාවිතා කිරීම.	ප්‍රතිඵල ලබාදීම සඳහා අදාල දැනුම හෝ ශිල්පීය ක්‍රම භාවිතා කිරීම.
	ගණනය කරන්න.	ගණිතමය හෝ තාර්කික ක්‍රම මගින් අගය තීරණය කිරීම.	විසඳුමක් ලබා ගැනීම සඳහා සංඛ්‍යාත්මක හෝ තාර්කික ක්‍රියාවලීන් පැහැදිලි කිරීම.
	තීරණය කරන්න	පර්යේෂණ හෝ ගණනය කිරීම් හරහා යමක් ස්ථාපිත කිරීම.	ගණනය කිරීමෙන් හෝ පර්යේෂණයකින් පසු යමක් සොයාගැනීම හෝ නිගමනය කිරීම.
	ප්‍රදර්ශනය කරන්න.	ක්‍රියාවලිය හෝ ක්‍රමය ප්‍රදර්ශනය කිරීම.	ව්‍යුහගත පියවර හරහා පැහැදිලි උදාහරණයක් පෙන්වීම.
	පිළියෙල කරන්න.	භාවිතය සඳහා ද්‍රව්‍ය හෝ තොරතුරු සංවිධානය කිරීම.	කාර්යයක යෙදීමට පෙර අවශ්‍ය විස්තර සකස් කිරීම.
	භාවිත කරන්න	සංකල්පයන් මෙවලමක් හෝ ක්‍රමයන් අරමුණක් සඳහා භාවිතා කිරීම.	අදාල දැනුම හෝ සම්පත් යෝග්‍ය පරිදි භාවිතා කිරීම.
	ඉදිරිපත් කරන්න.	සඵලදායී ලෙස තොරතුරු බෙදා ගැනීම.	මූලික දැනීම සහ අවබෝධයන් පැහැදිලිව සහ වෘත්තීමය වශයෙන් ඉදිරිපත් කිරීම.
විශ්ලේෂණය ව්‍යුහය සහ සම්බන්ධතා අවබෝධ කරගැනීම සඳහා තොරතුරු කුඩා සංරචකවලට වෙන් කිරීම	විශ්ලේෂණය කරන්න	සංරචක අවබෝධ කරගැනීම සඳහා විස්තරාත්මකව පරීක්ෂා කිරීම.	වඩා හොඳ අවබෝධයක් සඳහා තොරතුරු ප්‍රධාන කොටස්වලට බෙදීම.
	සසඳන්න	සමානකම් සහ /හෝ වෙනස්කම් පරීක්ෂා කිරීම.	ප්‍රධාන පොදු ලක්ෂණ සහ වෙනස්කම් පෙන්වා දීම.
	වෙනස්කොට දක්වන්න	යමක් තවෙකින් වෙනස් කොට හඳුනා ගැනීම.	යමක් එකිනෙකට වෙනස් වන්නේ කුමකින්ද යන්න හඳුනා ගැනීම.
	පරීක්ෂා කරන්න	යමක ස්වභාවය තීරණය කිරීම සඳහා එය පරීක්ෂා කිරීම.	යමක් හොඳින් තේරුම් ගැනීම සඳහා එය හොඳින් නිරීක්ෂණය කිරීම.
	සැකිල්ලක් සේ දක්වන්න	සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම.	ප්‍රධාන අංශ පිළිබඳව සංවිධානාත්මක දල විශ්ලේෂණයක් ලබා දීම.
	ක්‍රියා කරන්න	අත්හදා බැලීමක්, සමීක්ෂණයක් හෝ අධ්‍යනයක් සඳහා මූලිකාංග සංවිධානය කිරීම.	කාර්යයන් ක්‍රමානුකූලව සිදු කිරීම සඳහා ව්‍යුහාත්මක පියවර අනුගමනය කිරීම.
	වාර්තා කරන්න	සොයාගත් දෑ ව්‍යුහාත්මකව ඉදිරිපත් කිරීම.	විශ්ලේෂණය කළ තොරතුරු පැහැදිලි හා තාර්කික ආකෘතියකින් ඉදිරිපත් කිරීම.
අගය කරන්න නිර්ණායක හෝ ප්‍රමිතීන් මත පදනම්ව අදහස් හෝ ද්‍රව්‍යයන් වල වටිනාකම හෝ ගුණාත්මක භාවය පිළිබඳව විනිශ්චයන් සිදු කිරීම.	උපදෙස් දෙන්න	යෝජනා හෝ නිර්දේශ ඉදිරිපත් කිරීම	විශ්ලේෂණ මත පදනම්ව දැනුවත් මග පෙන්වීමක් ලබා දීම.
	අගය කරන්න	වටිනාකම් සඵලදායීතාවය හෝ බලපෑම පිළිබඳව විවේචනාත්මකව තක්සේරු කිරීම.	නිර්ණායක මත පදනම්ව යම් දෙයක ගුණාත්මකභාවය හෝ අදාලත්වය නිශ්චය කිරීම.
	සකස් කරන්න	ව්‍යුහගත ප්‍රවේශයන් හෝ සැලැස්මක් සංවර්ධනය කිරීම.	හොඳින් අර්ථ දක්වන ලද ක්‍රමෝපායන් හෝ උපාය මාර්ගයන් සකස් කිරීම.
	නිර්දේශ කරන්න	සුදුසු ක්‍රියාමාර්ග පිළිබඳ යෝජනා කිරීම.	තාර්කික කරුණු මගින් සහායවන ප්‍රවේශයන් යෝජනා කිරීම.
නිර්මාණය කිරීම සුසංයෝගී හෝ ක්‍රියාකාරී සමස්තයක් සෑදීම සඳහා නව ආකාරවලින් මූලද්‍රව්‍ය ඒකාබද්ධ කිරීම නව අදහස්, නිෂ්පාදන හෝ අවබෝධ කර ගැනීමේ ක්‍රම ජනනය කිරීමේ හැකියාව	නිර්මාණය කරන්න	අළුත් දෙයක් නිර්මාණය කිරීම.	අපූර්ව සහ අරමුණු සහගත යමක් සංවර්ධනය කිරීම.
	තක්සේරු කරන්න	ගුණාත්මක භාවය, හැකියාව හෝ ස්වභාවය තක්සේරු කිරීම හෝ ඇගයීම.	පවතින තොරතුරු මත පදනම්ව තර්කානුකූල විනිශ්චයන් ලබා දීම.
	සංවර්ධනය කරන්න	අදහසක්, නිශ්පාදනයක් හෝ සංකල්පයක් පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම.	කාලයත් සමගින් අදහස ශක්තිමත් හා වැඩි දියුණු කිරීම.
	යෝජනා කරන්න	සලකා බැලීම සඳහා වන සැලැස්මක් හෝ සංකල්පයක් පිළිබඳ යෝජනා කිරීම.	අදහසක් හෝ ව්‍යුහගත නිර්දේශයක් ඉදිරිපත් කිරීම.
	සංයෝජනය කරන්න	විවිධ සංරචකයන්ගේ සංයෝජනය මගින් සංගත සමස්ථයක් නිර්මාණය කිරීම.	විවිධ අදහස් හෝ අවබෝධයන් අර්ථවත් වූ නිගමනයකට ඒකාබද්ධ කිරීම.
	සැලසුම් කරන්න	යමක් සඳහා ව්‍යුහගත සැලැස්මක් නිර්මාණය කිරීම.	නිශ්පාදනයක් හෝ ක්‍රියාවලියක් සඳහා සවිස්තරාත්මක ව්‍යුහයන් සකස් කිරීම.
	ගොනු කරන්න	විවිධ මූලාශ්‍රයන්ගෙන් තොරතුරු එක් රැස් කිරීම.	එකතු කරන ලද දත්ත පුළුල් ආකෘතියකට සංවිධාන කිරීම.